# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2475/10 - 2026 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා - 2026.02.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 109910 දරන සහ අංක 278, හයිලෙවල් පාර, මහරගම හා සතර ගොඩනැගිල්ල, 1/1/3, මහමෙසවත්ත පාර, මහරගම යන ලිපිනයන්හි පිහිටා ඇති උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ලංකා නිපොන් බිස්ටෙක් ඉන්ස්ටියුට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 ජුනි මස 27 දින අංක 2286/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වැනි උපලේඛනයේ, එහි I වැනි තීරයේ දැක්වෙන "මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය" යන සටහනට හා එහි II වැනි තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වැනි උපලේඛනයේ පිළිවෙලින් I වැනි සහ II වැනි තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වැනි උපලේඛනය**

කොන්දේසි

1. ලංකා නිපොන් බිස්ටෙක් ඉන්ස්ටියුට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති, තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය (එස්. එල්. කියු. එෆ්. 5 වන ස්ථරය) සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී:-

   (i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා ලංකා නිපොන් බිස්ටෙක් ඉන්ස්ටියුට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>උපාධිය | *II වන තීරය*<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය | (බීඅයිටී) |

**ආචාර්ය හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0081

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.